www.kidworship.kr

# ශුද්ධ වූ පාවුල් තුමා

–Saint Paul–



120Page

**පොතේ ගුරා** සාවුල් හොඳට ඉගෙන්ගත්ත කෙනෙක් වුණත් ඔහු යේසුස්වහන්සේව දැනගෙන සිටියේ නෑ. එපමණක් නොව එයා යේසුස්වහන්සේ විශ්වාස කරපු අයට වෛර කළා, හිරගෙයි දැමුවා. දවසක් එයා උත්තම පූජකයා ළඟට ගොස් මෙහෙම අහනවා.

**සාවුල්** යේසුස්වහන්සේය විශ්වාස කරන අයව බලාත්කාරයෙන් අල්ලගෙන එන්න පුලුවන් ආකාරයේ ලියුමක් කරුණාකරලා මට දෙන්න.

**පොතේ ගුරා** යේසුස්වහන්සේගේ ගෝලයන්ට පීඩා කරලා, ඔවුන් අල්ලගෙන එන පිණිස සාවුල් මේ ලියුමත් රැගෙන, දමස්කස්වලට යනවා.

........................................................................................



121Page

**පොතේ ගුරා** එහෙත් සාවුල් දමස්කස්වලට ළංවෙත්ම, හදිසියෙන් ආලෝකයක පැමිණ ඔහු වටේටම බැබළෙන්නට වුණා. ඒ ආලෝකයේ තිබූ දීප්තියේ අධිකකම හේතුවෙන් සාවුල්ට ඇස් දෙකම අරින්නට නොහැකි වුණා. මේ ආලෝකයේ අධික දීප්තිමත්කම හේතුවෙන් තමුන්ගේ දෑත්වලින් මුහුණ වසාගත්තත් සාවුල්ට කිසිම දෙයක් පෙණුනේ නෑ. ඒ වෙලාවේ ඔහුට ස්වර්ගයෙන් හඬක් ඇසුණා.

**යේසුස්වහන්සේ** සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මක්නිසාද?

**සාවුල්** ස්වාමීනි, ඔබ කවුද?

**යේසුස්වහන්සේ** මම ඔබ පීඩා කරන යේසුස්

**පොතේ ගුරා** යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේ විසින් පොරොන්දු වූ යුදෙව්වන්ගේ රජ කියා සාවුල් විශ්වාස කළේ නෑ. යේසුස්වහන්සේගේ කුරුසිපත් වීම සහ නැවත නැගිටීමත් ඔහු විශ්වාස කළේ නෑ. ඒ නිසා ඔහු යේසුස්වහන්සේගේ වචන ඇසුවාම ගොඩක් පුදුමයට පත් වුණා.



122Page

**යේසුස්වහන්සේ** සාවුල් නැගිට දමස්කයට යන්න. එහිදී ඔබ කළ යුතු දේ ගැන කියනු ලබනවා.

........................................................................................

**පොතේ ගුරා** සාවුල් බිමෙන් නැගිට ඇස් ඇරියාම, කිසිවක්ම පෙණුනේ නෑ. ඒ නිසා එක් මිනිසෙක් සාවුල්ගේ අතින් අල්ලගෙන යමින් ඔහුට මඟ පෙන්නුවා.

........................................................................................



123Page

**පොතේ ගුරා** දවස් 3ක් පුරා සාවුල් අන්ධව සිටියා. ඔහු කිසිවක් කෑවේවත් බීවේවත් නෑ. සාවුල් පසුතැවිලිවෙමින් මුළු හදවතින්ම යේසුස්වහන්සේට යාච්ඤා කළා.

**යේසුස්වහන්සේ** අනනියස් ... යූදස් ගෙදරට ගිහින් අහන්න, තාර්සස් හී සාවුල් නම් කෙනෙක් ඉන්නවාද කියා. මන්ද ඔහු යාච්ඤා කරමින් සිටින්නේ, එයාට අත තබා එයාගේ පෙනීම නැවත එයාට ලබාදෙන්න.



124Page

**අනනියස්** ස්වාමීනි, මේ සාවුල් ගැන මම ගොඩක් වාර්ථාවන් අහලා තියෙනවා. මේ සාවුල් යෙරුසලමේ සිටින ඔබවහන්සේගේ ශුද්ධවන්තයන්ට ගොඩක් හානි කරලා තියෙනවා. එයා උත්තම පූජකයාගේ අධිකාරිය යටතේ, දමස්කයට ආවේ, ඔබවහන්සේගේ නාමය ගැන කතා කරන හැමකෙනෙක්ම අත්අඩංගුවට ගන්නයි.



125Page

**යේසුස්වහන්සේ** යන්න... අන්‍යජාතිකයන්ට, ඔවුන්ගේ රජුන්ට සහ ඉශ්‍රායෙල් සෙනඟට මාගේ නාමය ගෙන යන පිණිස, මේ මනුෂ්‍යයා මා විසින් තෝරාගත් භාජනයක්. මාගේ නාමය උදෙසා කොපමණ දුක්විඳින්නට යනවාද කියා මා විසින් ඔහුට පෙන්වන්නට යනවා.

........................................................................................



126Page

**පොතේ ගුරා** අනනියස්, සාවුල් සොයාගෙන ඒ නිවසට ගොස් ඔහුට අත් තබනවා.

**අනනියස්** ඔයා මේ දමස්කයට එද්දී ඔයාට මඟදී හමු වූ යේසුස්වහන්සේ, ඔබට නැවත පෙනීම ලබාදෙන පිණිස සහ ඔබ ශුද්ධාත්මයෙන් පූර්ණ කරන පිණිස මා මෙහි එව්වා.

**පොතේ ගුරා** අනනියස් යාච්ඤා කොට අවසන් වූ විට, සාවුල්ගෙන් ඇස්වලින් කොරපොතු වැනි යමක් බිමට වැටී නැවත ඔහුට පෙනීම ලැබුණා. සාවුල් නැගිට බෞතීස්මය ලබයි. දැන් සාවුල් යේසුස්වහන්සේගේ ගෝලයෙක්...

**පොතේ ගුරා** කෑම කා ශක්තිමත් වූ සාවුල් දමස්කයේ සිටි ගෝලයන් සමඟ දවස් කිහි-පයක් ගත කළා. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි කියමින් ඉක්මණින්ම සාවුල් සිනගෝගවල දේශනා කරන්නට පටන් ගත්තා.

**සාවුල්** යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා, උන්වහන්සේ කෙරේ විශ්වාස කරන්න!

**මිනිසා** මොකක් ? මේ අර යේසුස්වහන්සේගේ ගෝලයන්ට පීඩා කරලා, එයාලව අත්අඩංගුවට ගත් කෙනා නේද?

**කාන්තාවක්** ඇත්තටම...! මේක වෙන්නේ කොහොමද? මේ මොනවද වෙන්නේ ?

**පොතේ ගුරා** හැමදෙනාම පුදුමයට පත් වුණා. ඒත් සාවුල්, යේසුස්වහන්සේ ක්‍රිස්තුස් කියා ඔප්පු කරන පිණිස වඩ වඩා බලවත් වුණා.

........................................................................................



127Page

**පොතේ ගුරා** දවස් ගණනාවකට පසුව යුදෙව්වන් සාවුල් ව මරන්නට සැලසුම් කළා. එහෙත් සාවුල්ට ඔවුන්ගේ සැලසුම් දැනගන්නට ලැබුණා. දිවා රෑ ඔවුන් නඟරයේ දොරටු මුර කරමින්, සාවුල්ව මරණ පිණිස රැක සිටියා, ඒත් සාවුල්ගේ අනුගාමිකයන් රාත්‍රියේ ඔහුව ගෙනගොස් කූඩයක බහා නගරයේ තාප්පයෙන් පිටතට දමා පැනයන්නට සැලැස්සුවා.

මේ සාවුල් නම් පාවුල් යැයි නම් ලත් ප්‍රසිද්ධ ඉවැන්ජලිස්තවරයාය.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, යේසුස්වහන්සේට විරුද්ධව කතා කරන අය ගැන ටිකක් සිතමු. අපි ඒ අයව ප්‍රතික්ෂේප නොකරමු. ඒ අයටත් ජීවිත වෙනස් වීමක් ලබා දෙන්න යේසුස්වහන්සේ පුලුවන්. ඔව් ! විශ්වාස කරන්න.